**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.**
**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන**

**අවසාන පරීක්ෂණය (දෙවන අධ්‍යයන වාරය) - 2006/2007**

**ESP 1108 - අධ්‍යාපනයේ කළමනාකරණය**

**කාලය පැය තුනයි.**

---

දිනය - 2007.12.01 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

I කොටසේ සියළුම ප්‍රශ්නවලටත් II වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

**I - කොටස**

01. "ක්‍රියාකාරී තලයේදී කළමනාකරණය සහ පරිපාලනය කාසියක දෙපැත්ත මෙනි." කෙටියෙන් අදහස් දක්වන්න.

02. පීටර් ඩ්‍රකර් හඳුන්වාදුන් කළමනාකරණ න්‍යායයේ අඩංගු ප්‍රධාන සංකල්පය කුමක් ද?
එම න්‍යායයෙහි ලා ඩ්‍රකර් සඳහන් කල, කළමනාකරුවා සතු භූමිකා අතුරින් තුනක් (03) නම් කරන්න.

03. සම්බන්ධීකරණය සහ අභිප්‍රේරණය කළමනාකරණ ක්‍රියාවලියේ එක් මූලිකාංගයක ප්‍රධාන අංශ දෙකකි. එම කළමනාකරණ මූලිකාංගය කෙටියෙන් පැහැදිලි කරන්න.

04. අධ්‍යාපන කළමනාකරණය විමධ්‍යගත කිරීමෙහි ලා 1984 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ගත් එක් වැදගත් පියවරක් සඳහන් කරන්න. එම පියවර ගැනීමට හේතු වූ කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න.

05. "මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම විදුහල්පතිවරයෙකුට අත්‍යාවශ්‍ය වේ." කෙටියෙන් අදහස් දක්වන්න.

06. කලාප අධ්‍යාපන නිලධාරීන් පාසල් අධීක්ෂණයේ යෙදෙන විට අවධානය යොමු කල යුතු අංශ පහක් (05) සඳහන් කරන්න.

07. විදුහල්පතිවරයෙකුගේ උපදේශන නායකත්වයේ ගති ලක්ෂණ තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. AB පාසලක 'විෂය සමායෝජක' භූමිකාව කෙටියෙන් විස්තර කරන්න.

II - කොටස

09. නොයෙක් කළමනාකරණ න්‍යායවාදීන් විවිධ කළමනාකරණ ශෛලීන් පිළිබඳව සැලකිලිමත් විය.

i. කළමනාකරණ ශෛලීන් දෙකක් (02) නම් කරන්න.

ii. රොබර්ට් බ්ලේක් සහ ජේන් මව්ටන් ඉදිරිපත් කල කළමනාකරණ ග්‍රිඩය විස්තර කරන්න.

iii. කළමනාකරණ ග්‍රිඩයේ ඔබගේ පාසල් විදුහල්පතිවරයාට සුදුසු ස්ථානය තීරණය කොට ඒ සඳහා හේතු දක්වන්න.

10. "ශ්‍රී ලංකාව කුඩා රටක් වුවද එහි පාසල් අධ්‍යාපන පද්ධතිය ඉතා සංකීර්ණ වේ." අදහස් දක්වන්න.

11. පහත සඳහන් ඕනෑම තුනක් (03) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ගුරුවරයා සම්පත් කළමනාකරුවෙකු ලෙස
ii. පාසල් කළමනාකරණ මණ්ඩලය
iii. පාසල් ගුරුවරුන් අභිප්‍රේරණය
iv. පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීම හා සම්බන්ධ කළමනාකරණ මතවාද
v. ඉන්දියානු පාසල් පද්ධතියෙහි මානව සම්පත්

12. 3 වන වර්ගයේ පාසල්වල සේවය කරන, පූර්වයෙන් කිසිදු ආකාරයක කළමනාකරණ පුහුණුවක් නොලත් විදුහල්පතිවරුන් විසි දෙනෙකු සඳහා මසක කළමනාකරණ පුහුණු වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කරන ලෙස ඔබෙන් ඉල්ලා ඇතැයි සිතන්න.

පහත සඳහන් දෑ ඇතුලත් වනසේ එවැනි වාර්තාවක් සකස් කරන්න.

අ. වැඩ සටහනේ අරමුණු
ආ. අන්තර්ගතයේ සැකිල්ල කාල රාමු සහිතව
ඇ. ඉගැන්වීමේ ක්‍රමවේද
ඈ. තක්සේරු පටිපාටිය
ඉ. අවශ්‍ය සම්පත්

13. මැක් වෙබර් සම්භාව්‍ය සංවිධාන න්‍යායවාදියෙකි.

i. ඔහුගේ න්‍යායය හඳුනාගෙන එහි ලක්ෂණ පැහැදිලි කරන්න.

ii. පහත සඳහන් දෑ කෙරෙහි වෙබර් ගේ අදහස් සාකච්ඡා කරන්න.

අ. සංවිධාන
ආ. බලය
ඇ. අධිකාරිත්වය

14. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සන්දර්භය තුල පහත සඳහන් දෑ දැඩි බලපෑම් ඇති කරන මතවාද බවට පත්වෙමින් අයහපත් තත්වයක් නිර්මාණය කර ඇත.

අ. කුඩා පාසල් පවත්වාගෙන යාමේ අරගලයක යෙදී සිටී.
ආ. විශාල පාසල්වලට දැරිය නොහැකි ඉල්ලුමක් ඇත.

පහත සඳහන් දෑ කෙරෙහි අවධානය යොමු කරමින් එම මතවාද විශ්ලේෂණය කරන්න.

i. මතවාද පිළිබඳ විස්තරය
ii. එම තත්වය ඇතිවීමට හේතු
iii. තත්වය යහපත් අකට හැරවීමට යෝජනා

- හිමිකම් ඇවිරිණි. -